18 වන පිටෙන්

න් කුල කාන්තාවක සරණ පාවා ගතයුතුය යන අදහස විජයට සිය සගයන් ඉදිරිපත් කරන අංගයක්ද, විජය එය කුවේණියට දන්වන අංගයක්ද පෙළ ගැන්විණ. මේ වග දැනගත් කුවේණිය කම්පා වන ආකාරය වඩාත් හොඳින් කළ හැකිව තිබුණා නොවේදැයි තරුණ ශිල්පිණිය පෙර දැක්වූ කුසලතා සලකා බලන සඳ සිතට නැගින.

කුවේණිය, ජීවහත්ත හා දිසාලා දරුවන් කැටුව නික්ම යාමත්, සිය නෑයින් අතින් විනාශ වීමක්, මරණයට කලින් ශාප කිරීමත් අනතුරුව පෙළගන්වා තිබිණ. ඉතාමත්ම භාවාත්මක හා ආවේගාත්මක රඟපෑමක යෙදීමට මෙහිදී කුවේණිය වෙනුවෙන් රඟ පෑ තරුණියට සිදුවෙයි. ඇයගේ නර්ථන කුසලතා තරමටම රංගන කුසලතා බලාපොරොත්තුවිය නොහැකි වුවද ඊට සාධාරණ ඉටුකිරීමට ඇය දරණ ප්‍රයත්නය ප්‍රශංසනීයයි. කුවේණියගේ මරණයෙන් පසුව අනෙකුත් දරුවන්ගේ කුසලතාද අනෙකුත් නර්ථන වින්‍යාසයක්ද ඉදිරිපත් කිරීමට නර්ථනාචාර්යවරිය නැවතත් ඓතිහාසික පසුබිම සරණ යන්නීය. පසුබිම් කථනයක් මඟින් සම්බන්ධීකරණය වන මෙම නැටුම් අංග අතරට "සුළඟ හා ජලය" , " මිහිකත", "අග්නි" , "සම්ප්‍රදායික", ගැමි , හා අස්වනු නෙළීමක් වැඩි අංග පෙළ ගැන්වෙයි. අපගේ හෙළ නැටුම් අතරේ එන වන්නම්, ප්‍රශස්ති, ගැමි, වෘත්තීමය නැටුම් ක්‍රමවේදයන් ඉදිරිපත් කිරීමේදී එම් ඓතිහාසික පසුබිම දැනගැනීම වැදගත් වුවද එය ප්‍රසංගයේ




පලායාමට බලපෑමක් ඇති කලා නොවේදෙයි සිතේ.

ත්‍රිවිධ රත්නයේ ආශිර්වාද පතමින් නිමාවෙන ප්‍රසංගය අවසානයේ ඊට සහභාගී වු දරු දැරියන් එකසිය පනහකට වැඩි පිරිස වේදිකාවට එක් රැස්වන්නේ නෙතට සතුටු කඳුලක් නංවමිනි. එකපේළියක මොහොතක් රඳවා තැබීමට බැරි තරමේ කුඩා වුන් ද, තාරුණ්‍යයෙන් ඔද වැඩී මද කිපුණ ගජයන් වන් යෞවන යෞවනියන්ද එක්ව එකසිය ගණනක පිරිසක් එක අරමුණක, එක වේදිකාවක් වටා පැය දෙක තුනකට ගොනු කිරීම නම් අරුමයක්මයි. මේ සියල්ලට අවැසි ඉඳුම් හිටුම්, වස්ත්‍ර මාරු කිරීමට ඉඩකඩ, සහය, සෞඛ්‍ය සේවා, ප්‍රථමාධාර විධි, ප්‍රවාහන කටයුතු , ආරක්ෂාව යනාදී සියල්ල මනා කළමණා කාරිත්වයකින් කරගැනීමට නර්ථනාචාර්යවරියට සහය වු දෙමාපිය හිතවතුන් පිළිබඳවද සිහිකළ යුතුව ඇත්තේය. වේදිකා පරිපාලනය කළ ගාමිණී රණසිංහ, ශාන්ත නානායක්කාර ඇතුළු සහායකයින්, ශබ්ද පරිපාලක අනුර අබේරත්නද ඒ අතර වෙති.

මේ සියල්ල ගොනුකරගත් රසිකා කුලසිංහ නර්ථනාචාර්යවරිය ඇතුළු විශ්ව රංගායතනයට අපගේ සුභාශිංසන ! පන් මනෝ ලියවිල්ල ඉවර කළා.

**Sannasa Online**
**www.sannasa.com**
**www.sannasa.net**

# සෙන්ට් ඕබන්ස් සිංහල භාෂා පාසලේ වාර්ෂික විවිධ ප්‍රසංගය

ශ්‍රී ලාංකික දරු දැරියන් 200 ක් පමණ ඉගෙනුම ලබන වික්ටෝරියාප්‍රාන්තයේ සෙන්ට් ඕබන්ස් සිංහල භාෂා පසලේ වාර්ෂික විවිධ ප්‍රසංගය පසුගිය දා පැවැත්වුණි. විදුහලේ ප්‍රධාන සංවිධායක මිල්කින් බණ්ඩාරනායක මහතා ඇතුලු ගුරු මණ්ඩලය සහ දෙමාපියන් ගේ මග පෙන්වීම යටතේ අපේ දරු දැරියන් දැක්වූ හපන්කම් පැසසුම් ලැබිය යුතු තරම් උසස් මට්ටමක විය.

දක්ෂ ගුරු මණ්ඩලයක අති මහත් කැපවීම නිසාවෙන් දිනෙන් දින ප්‍රගතිය කරා ගමන් කරමින් තිබෙන සෙන්ට් ඕබන්ස් සිංහල භාෂා පාසලට රොක්බෑන්ක් බෞද්ධ විහාරාධිපති පල්ලෙවෙල දේවරක්ඛිත හිමියන්ගෙන් ලැබෙන මාර්ගෝපදේශකත්වයද ඉතා වැදගත් ය.

සටහන - ජගත් ජේ එදිරිසිංහ



